රිච්මන්ඩ් විද්‍යාලයීය පාසල් සංවර්ධනය සමිතිය

2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

විගණකවරුන්ගේ වාර්තාව හා මූල්‍ය ප්‍රකාශන

EY

Building a better
working world

EY
Building a better working world

Ernst & Young
Chartered Accountants
74, Sri Devamitta Mawatha
China Garden
Galle
Sri Lanka

Tel : +94 91 224 2487, 222 2503
+94 91 493 1090
Fax : +94 91 224 2487
ey.com

WRHF/CAS

**ස්වාධීන විගණකවරයාගේ වාර්තාව**
**රිච්මන්ඩ් විද්‍යාලයීය පාසල් සංවර්ධන සමිතියේ සාමාජිකයන් වෙත**

**මූල්‍ය ප්‍රකාශන මත වාර්තාව**

මේ සමග ඇති රිච්මන්ඩ් විද්‍යාලයීය පාසල් සංවර්ධන සමිතියේ 2018 දෙසැම්බර් 31 දිනට වූ මූල්‍ය තත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තිරණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශයක්ද වෙනත් පැහැදිලි කිරීමේ සටහන් වලින්ද සමන්විත මූල්‍ය ප්‍රකාශන අප විසින් විගණනය කරන ලදී.

**මූල්‍ය ප්‍රකාශන ප්‍රකාශන සඳහා කලමණාකාරීත්වයේ වගකීම**

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත වලට අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර සාධාරණව ඉදිරිපත් කිරිම සඳහා කලමණාකාරීත්වය වගකීමෙන් බැඳේ. මෙම වගකීමට වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමානාත්මක අවප්‍රකාශ වලින් තොර මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හා සාධාරණව ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගැනීම ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීම හා ව්‍යවහාර කිරීම සහ අවස්ථානුකූලව සාධාරණ වන්නා වූ ගිණුම්කරණ ඇස්තමේන්තු සැකසීමත් අතුලත් වේ.

**විගණන විෂය පථය හා මතයේ පදනම**

අපගේ වගකීම වන්නේ අපගේ විගණනය පදනම් කරගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමයි අප විසින් අපගේ විගණනය ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට අනුව සිදුකරණ ලදී. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක අවප්‍රකාශවලින් තොර වන්නේද යන්න පිළිබඳව සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස අප විසින් විගණනය සැලසුම් කර ඉටුකිරීමට එම ප්‍රමිතිවලින් අවශ්‍ය කෙරේ.

මූල්‍ය ප්‍රකාශනවල අගයන් හා හෙළිදරව් කිරීම් සනාථ කිරීම සඳහා උපකාරි වන සාක්ෂි සොදිසි පදනමක් මත පරික්ෂා කිරීම විගණනයට ඇතුලත් වේ.  භාවිතා කළ ගිණුම්කරණ මූලධර්ම සහ කළමණාකාරීත්වය විසින් කරන ලද වැදගත් ඇස්තමේන්තු තක්සේරු කිරීම මෙන්ම සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම ඇගයීමද විගණනයට ඇතුලත් වේ.

අපගේ උපරිම දැනීම හා විශ්වාසය අනුව අපගේ විගණනය සඳහා අවශ්‍ය සියළු තොරතුරු හා පැහැදිලි කිරීම් අපි ලබාගත්තෙමු. එබැවින් අපගේ විගණනය අපගේ මතය සඳහා සාධාරණ පදනමක් සපයන්නේයැයි අපි විශ්වාස කරමු.

**මතය**

අපගේ මතය අනුව අපගේ පරික්ෂණයන් ගෙන් පෙනියන අන්දමට  2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පාසල් සංවර්ධන  සමිතිය නිසි ගිණුම්කරණ වාර්තා පවත්වාගෙන ඇති අතර මූල්‍ය ප්‍රකාශන වලින් 2018 දෙසැම්බර් 31 දිනට සමිතියේ මූල්‍ය තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි  මූල්‍ය ක්‍රියාකාරීත්වය  හා මුදල් ප්‍රවාහ පිළිබඳ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත වලට අනුකූලව සත්‍ය හා සාධාරණ දර්ශනයක් පෙන්නුම් කරයි.

2019 මාර්තු මස 14 වැනි දින
ගාල්ලේදී

Partners: W R H Fernando FCA FCMA  M P D Cooray FCA FCMA  D K Hulangamuwa FCA FCMA LLB (Lond)  H M A Jayesinghe FCA FCMA

A member firm of Ernst & Young Global Limited

## රිච්මන්ඩ් විද්‍යාලීය පාසල් සංවර්ධන සමිතිය

විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය

2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

| ආදායම් | සටහන් | 2018<br>රු | ගළපන ලද<br>2017<br>රු |
|---|---|---|---|
| විශේෂ ආධාර | 3 | 3,648,110 | 5,891,330 |
| පා.සං.සමිති අරමුදල් හා සාමාජික ගාස්තු | 4 | 11,634,000 | 8,879,400 |
| ස්ථාවර තැන්පත් පොළී | 5 | 34,373 | 38,572 |
| ඉතුරුම් තැන්පත් පොළී | 6 | 637 | 20,642 |
| බදු ආදායම් | 7 | 3,639,983 | 2,985,648 |
| විවිධ ආදායම් | 8 | 11,010,181 | 10,643,398 |
| මුළු ආදායම් | | 29,967,283 | 28,458,989 |

| වියදම් | | 2018<br>රු | 2017<br>රු |
|---|---|---|---|
| නඩත්තු සේවා | 10 | 4,553,705 | 7,246,235 |
| අධ්‍යාපන සංවර්ධන වියදම් | 11 | 3,388,619 | 4,876,115 |
| විෂය සමගාමී බාහිර ක්‍රියාකාරකම් | 12 | 3,978,168 | 4,111,996 |
| ක්‍රීඩා | 13 | 8,912,467 | 6,232,238 |
| කාර්යාලීය වියදම් | 14 | 1,159,255 | 1,465,263 |
| මෙහෙයුම් වියදම් | 15 | 7,062,793 | 8,771,507 |
| මූල්‍ය වියදම් | 16 | - | - |
| වෙනත් වියදම් | 17 | 354,322 | 430,880 |
| ක්ෂය | 9.2 | 402,187 | 327,598 |
| මුළු වියදම් | | 29,811,516 | 33,461,830 |
| වර්ෂයේ අතිරික්තය | | 155,767 | (5,002,841) |

ERNST & YOUNG CHARTERED ACCOUNTANTS GALLE.

පිටු අංක 6 සිට 13 දක්වා වූ පිටුවල මූල්‍ය ප්‍රකාශන වලට අදාළ වූ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් ඇතුලත් වේ

## මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය
**2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

| වත්කම් | සටහන් | 2018 | 2017 |
|---|---|---|---|
| | | රු | රු |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපල පිරියත හා උපකරණ | 9 | 1,885,060 | 936,677 |
| ස්ථාවර තැන්පතු | 18 | 346,843 | 344,796 |
| | | 2,231,903 | 1,281,473 |
| **ජංගම වත්කම්** | | | |
| තොගය | 19 | 77,542 | 52,795 |
| වෙනත් ලැබිය යුතු | 20 | 830,239 | 610,239 |
| ජාතික ඉතිරිකිරීමේ බැංකුව-ඉතිරිකිරීමේ ගිණුම | | 27,404 | 4,003 |
| මහජන බැංකුව-ජංගම ගිණුම | | 447,748 | 1,573 |
| අතැති මුදල් | | - | - |
| | | 1,382,933 | 668,610 |
| **මුළු වත්කම්** | | 3,614,836 | 1,950,083 |
| **සංචිත** | | | |
| සමුච්චිත අරමුදල | | 1,095,317 | 6,098,158 |
| වර්ෂය තුළ අතිරික්තය (ඌණතාවය) | | 155,767 | (5,002,841) |
| | | 1,251,084 | 1,095,317 |
| **වගකීම්** | | | |
| ශිෂ්‍ය ව්‍යාපෘති අරමුදල් | 21 | 2,009,965 | - |
| උපචිත වියදම් | 22 | 353,787 | 854,767 |
| | | 2,363,752 | 854,767 |
| **මුළු වගකීම්** | | 3,614,836 | 1,950,083 |

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීමේ වගකීම කමිටු සාමාජිකයන් සතුය.

ERNST & YOUNG
CHARTERED ACCOUNTANTS
GALLE.

.............................. සම්පත් වේරගොඩ
සභාපති
විදුහල්පති
රිච්මන්ඩ් විද්‍යාලය
ගාල්ල.

..............................
භාණ්ඩාගාරික

පිටු අංක 6 සිට 13 දක්වා වූ පිටුවල මූල්‍ය ප්‍රකාශන වලට අදාළ වූ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් ඇතුලත් වේ

2019.03.14 වැනි දින,
ගාල්ලේදී.

රිච්මන්ඩ් විද්‍යාලීය පාසල් සංවර්ධන සමිතිය

ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශනය

**2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

| | සමුච්චිත අතිරික්තය (ඌණතාවය) | එකතුව |
|---|---|---|
| | රු | රු |
| 2016.01.01 දිනට ශේෂය | 18,592,031 | 18,592,031 |
| වර්ෂය තුළ අතිරික්තය/(ඌණතාවය) | (12,494,783) | (12,494,783) |
| 2017.01.01 දිනට ශේෂය | 6,098,158 | 6,098,158 |
| වර්ෂය තුළ අතිරික්තය/(ඌණතාවය) | (5,002,841) | (5,002,841) |
| 2018.01.01 දිනට ශේෂය | 1,095,317 | 1,095,317 |
| වර්ෂය තුළ අතිරික්තය/(ඌණතාවය) | 155,767 | 155,767 |
| 2018.12.31 දිනට ශේෂය | 1,251,084 | 1,251,084 |

ERNST & YOUNG
CHARTERED ACCOUNTANTS
GALLE.

පිටු අංක 6 සිට 13 දක්වා වූ පිටුවල මූල්‍ය ප්‍රකාශන වලට අදාළ වූ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් ඇතුලත් වේ